**ශීර්ෂය - 323 - නීති කටයුතු දෙපාර්තමේන්තුව**

--------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

නීති කටයුතු දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව නීති කටයුතු දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජූනි 21 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 අගෝස්තු 02 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට නීති කටයුතු දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම ගැලැපුම් ශේෂය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව 2021 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඍණ රු.652,892 ක් වී තිබුණි. සංශෝධිත ACA – 7 ආකෘතියේ සඳහන් අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ද 2021 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගැලැපුම් ශේෂය ඍණ රු.652,892 ක් වී තිබුණි. නමුත් අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ අග්‍රිම ගැලපුම් ශේෂය ධන (+) රු.652,892 ක් විය යුතුව තිබුණත් එය ඍණ සංඛ්‍යාවක් ලෙස දක්වා තිබීම හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය 0 (ශුන්‍ය) ක් ලෙස දැක්වීම තාර්කිකව සිදු වී නොමැති බව නිරීක්ෂණය විය. | විගණන නිරීක්ෂණය හා එකඟ නොවේ. 2021.12.30 දිනැති අංක SA/MAA/02/01/01 දරන රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය අනුව දෙපාර්තමේන්තුව විසින් 2021 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කෙරේ. එහි 2021 වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම්වලින් මුළු වියදම අඩු කළ විට 2021.12.31 දිනට දෙපාර්තමේන්තුවේ අග්‍රිම ශේෂය ඍණ රු.652,892 ක් වේ. තවද, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ 2021.12.31 දිනට අග්‍රිම ශේෂය ලෙස දැක්වීමට ඇත්තේ අග්‍රිම ගිණුම් පිළිබඳ ප්‍රකාශයෙහි (ACA 3) 2021.12.31 දිනට ආයතන පොත් අනුව ශේෂය වේ. එහි අගය 0 වේ. තවද, ඉහත සඳහන් අංක දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 7.5 හි සඳහන් අවශ්‍යතාවයන් පරිදි දෙපාර්තමේන්තු අග්‍රිම ශේෂය නිවැරදිය. | 2021 නොවැම්බර් 26 දිනැති අංක 2021/03 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන තාර්කිකව පිළියෙළ කළ යුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යභාරයන් ඉටු නොකිරිම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2021 වර්ෂයේදී අනුමත කිරීමට නියමිතව තිබූ කොළඹ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය අසාමූහිකරණය කිරීමේ පනත් කෙටුම්පත, සුරක්ෂිතලත් ගනුදෙනු පනත් කෙටුම්පත, දේශීය භාණ්ඩාගාර බිල්පත් | **කොළඹ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය අසාමූහිකරණ කිරීමේ පනත් කෙටුම්පත** 2021 අංක 19 දරණ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත 2021.09.21 වන දින පාර්ලිමේන්තුවේදී සම්මත කර ඇති බවත් එය සම්මත වී | අනුමත කිරීමට නියමිත පනත් කඩිනමින් සම්මත කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | ආඥා පනත, ලියාපදිංචි ස්කන්ධ බිල්පත් ආඥා පනත, ලෝහාර් ආර්යා ණය අරමුදල් පනත, ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය (ස්ථාපිත කිරීමේ) පනත් කෙටුම්පත සහ 2009 අංක 23 දරන ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය (සංශෝධිත) පනත 2021 දෙසැම්බර් 31 දින වන විටත් සම්මත කර නොතිබුණි. | වසරක් පමණ ගිය පසු මෙම පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට අදහස් කළ බැවින් එය 2021 වර්ෂයේදී ඉදිරිපත් නොකරන ලදි.<br><br>**සුරක්ෂිත ලත් ගනුදෙනු පනත් කෙටුම්පත**<br>දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥා පනත හා ලියාපදිංචි ස්කන්ධ බිල්පත් ආඥා පනත යන පනත් සඳහා තවදුරටත් අවශ්‍ය සංශෝධන සිදු කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ සාකච්ඡා කරමින් පවතී.<br><br>**ලෝහෝර් ආර්යා ණය අරමුදල් පනත**<br>නව අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් සකස් කරමින් පවතී.<br><br>**ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය පනත් කෙටුම්පත**<br>මෙය පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පතකි. පාර්ලිමේන්තුව විසින් අවශ්‍ය සංශෝධන නීති කෙටුම්පත් සම්පාදක වෙතින් සිදු කර නැවත යොමු කරන ලෙස දන්වා ඇත. එබැවින් එය තවදුරටත් සලකා බලන බව දන්වන ලදි.<br><br>**2009 අංක 23 දරන ශ්‍රී ලංකා සහතික ලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය (සංශෝධිත) පනත**<br>නව අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් සකස් කරමින් පවතී. | |
| (ආ) | 2021 වර්ෂයේදී සංශෝධනය කිරීමට නියමිත වූ 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පණත, 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත, 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත, 2005 අංක 25 දරන ත්‍රස්තවාදටය මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනත, 1990 අංක 2 දරන ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත, 1938 අංක 53 දරන ලංකා බැංකු ආඥා පනත, 2000 අංක 43 දරන රක්ෂණ | මෙහි සඳහන් පනත් එක් එක් බාහිර ආයතනයන්හි විෂය පථයන්ට වැටෙන බැවින් එකී ආයතන සමඟ සාකච්ඡා කර අවසන් කෙටුම්පත සකස් කළ යුතු වේ. ඒ අනුව අවසන් කෙටුම්පත සකස් කරමින් පවතී. | සංශෝධනය කිරීමට නියමිතව තිබෙන පනත් කඩිනමින් සංශෝධනය කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | කර්මාන්තය විධිමත් කිරීමේ පනත, සමාගම් පනත සහ නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යන පනත් සඳහා 2021 දෙසැම්බර් 31 දින වන විටත් අදාළ සංශෝධන සිදු කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර නොතිබුණි. | | |
| (ඇ) | 2021 වර්ෂයේදී ණය නියාමන අධිකාරිය ස්ථාපිත කිරීමට නියමිතව තිබුණ ද, 2021 දෙසැම්බර් 31 දින වන විටත් එය ස්ථාපිත කර නොතිබුණි. | ණය නියාමන අධිකාරිය ස්ථාපිත කිරීමට අදාළ අවසන් ලේඛන මේ වන විට පරීක්ෂා කරමින් පවතී. සති 02 ක් ඇතුළත එය අවසන් කෙරේ. | ණය නියාමන අධිකාරිය කඩිනමින් ස්ථාපිත කළ යුතු වීම. |
| (ඇ) | නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් ලබා ගැනීමට, නීති කටයුතු දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ සඳහා එවා තිබුණු පසුගිය වර්ෂයේ සිට පවතින ලිපිගොනු 09 ක හා සමාලෝචිත වර්ෂය තුළ ලැබී තිබූ ලිපිගොනු 03 ක වැඩ කටයුතු 2021 දෙසැම්බර් 31 දින වන විටත් නිම කර නොතිබුණි. | නීතිපති උපදෙස් ලබා ගැනීම සඳහා පසුගිය වර්ෂයේ සිට පවතින ලිපිගොනු 09කින් 07 ක් සඳහා නීතිපති දෙපාර්තමේන්තුව විසින් නඩු පවරා ඇත. ඉතිරි ගොනු 02 සඳහා නීතිපති දෙපාර්තමේන්තුව විසින් නඩු පැවරීම සම්බන්ධයෙන් අවශ්‍ය ලේඛන සකස් කරමින් පවතින අතර අප විසින් අවශ්‍ය තොරතුරු සහ ලේඛන යොමු කරමින් පවතී. එසේම සමාලෝචිත වර්ෂය තුළ ලැබී ඇති ලිපිගොනු 03 සඳහාද නීතිපති දෙපාර්තමේන්තුව විසින් නඩු පැවරීමට කටයුතු සිදු කරමින් පවතින අතර විටින් විට ඒ සම්බන්ධයෙන් සාකච්ඡා පවත්වන අතර, අදාළ ලේඛන සහ අවශ්‍ය තොරතුරු ද දෙපාර්තමේන්තුව විසින් යොමු කෙරේ. | නීති කටයුතු සඳහා ලැබෙන ලිපිගොනු පිළිබඳව අප්‍රමාදව කටයුතු කළ යුතු වීම. |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාව 22 ක් වුවද, තථ්‍ය සේවක සංඛ්‍යාව 15 ක් වූ බැවින් සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු 07 ක් පැවැතුණි. | • පුරප්පාඩුව පවතින තනතුරු **07**න් අධ්‍යක්ෂ ජනරාල් තනතුර අමාත්‍ය මණ්ඩලය විසින් පත් කළ යුතු තනතුරකි**.** අමාත්‍ය මණ්ඩලය විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයකු පත් කළ අවස්ථාවක දී පුරප්පාඩුව පවතින සෙසු රියදුරු තනතුර පිරවීමට කටයුතු කෙරේ**.** අනෙකුත් පුරප්පාඩු තනතුරු මේ වන විට සම්පූර්ණ කර ඇත. | කාර්යසාධනයට අහිතකර අයුරින් බලපාන කාර්ය මණ්ඩල පුරප්පාඩු කඩිනමින් පිරවීමට කටයුතු කිරීම. |